**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 09/95**

මගේ අංකය: I/543 ඊ/02 ඩී/-2/94(II)
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි
කර්මාන්ත හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07
1995.03.14 දින

සියලුම ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>අන්තර් දීමනාව - රා.පරි.චක්‍රලේඛ අංක 33/94 හා 06/95</u>**

ඉහත සඳහන් විෂය යටතේ මා විසින් නිකුත් කරන ලද 1994.08.12 දින අංක 33/94 හා 1995.02.23 දින අංක 06/95 දරණ චක්‍රලේඛ කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවනු ලැබේ.

02. රජයේ අදාල සේවාවන්හි වැටුප් පරිමාණයන්ද, වැටුප් විෂමතාවයන් ඇතොත් එම විෂමතාවයන් ද පරීක්ෂාකොට කෙටි කාලයක් තුළදී රජය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා පූර්ණ බලතල සහිත ජනාධිපති කොමිෂන් සභාවක් අතිගරු ජනාධිපතිතුමිය විසින් පත් කිරීමට නියමිතය.

03. එම කොමිෂන් සභා වාර්තාව සහ නිර්දේශයන් සැලකිල්ලට ගනිමින් රජයේ අදල සේවාවන්හි ඇති සියළුම වැටුප් විෂමතාවයන් ඉවත් කිරීම සඳහා සම්පූර්ණ ක්‍රියාමාර්ගයක් ගැනීමට රජය අදහස් කර ඇත.

04. එම නිසා 1995 පෙබරවාරි මාසයෙන් පසු කාලය ඉහත සඳහන් 1994.08.12 දින අංක 33/94 දරන චක්‍රලේඛය හා 1995.02.23 දින අංක 06/95 දරන චක්‍රලේඛය අනුව ගෙවීම් කිරීම අත්හිටුවන ලෙස මෙයින් දන්වා සිටිනු ලැබේ. එයට පෙර කාලය සඳහා ගෙවීම් කළ හැකිය.

අ.කලේ/(**ආර්.එස්.ජයරත්න**)
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
වැවිලි කර්මාන්ත හා පාර්ලිමේන්තු
කටයුතු අමාත්‍යාංශය